D142

# ශ්‍රී ලංකාවේ කාර්මික අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව ශ්‍රම වෙළෙඳපොළ කෙරෙහි ඇති කරන බලපෑම

# Impact of Technical Education and Vocational Training on Labour Market in Sri Lanka


කුලප්පු ආරච්චිගේ ලලිතධීර

B.A (Economics) (Hon), [රුහුණ වි.වි.], M.A (Economics), [කොළඹ වි.වි.],

PDTTM [වයඹ වි.වි.]


නිබන්ධන උපදේශක - මහාචාර්ය අතුල ලක්ෂ්මන් රණසිංහ

පීඨාධිපති - කලා පීඨය

කොළඹ විශ්වවිද්‍යාලය

University of Colombo Library Sri Lanka

ආර්ථික විද්‍යා දර්ශනශූරී උපාධි නිබන්ධනය

ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය

කොළඹ විශ්වවිද්‍යාලය

2016

UCLIB
583489

## සාරාංශය

කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණුව ශ්‍රම වෙළෙඳපොළෙහි සැපයුම් අංශය තුළ එක් ප්‍රධාන විචල්‍යයක් ලෙස දැක්විය හැකි ය. ශ්‍රී ලංකාවේ මේ කාර්මික අධ්‍යාපන හා පුහුණුව සම්බන්ධව ගත් විට යටත්විජිත පාලන රාමුවෙන් නිදහස ලැබීමට පෙර සිට රටේ කර්මාන්ත හා සේවා පවත්වා ගෙන යැමට ප්‍රමාණවත් තරම් පුහුණු ශ්‍රමිකයන් නැති වූ බැවින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හා වැඩසටහන් පවත්වා ගෙන යැම ජාතික අශ්‍යතාවක් විය. මුල් කාලීන ව මේ ක්ෂේත්‍රය ඉල්ලුම් අභිමුඛව පවත්වා ගෙන ගිය ද 1970 දශකයෙන් පසු රටේ රැකියා ගැටලුවට විසඳුමක් ලෙස ද රජයේ විශේෂ අවධානයට ලක් වී ඇත. පසුගිය දශක දෙකක කාලය තුළ ක්ෂේත්‍රය කැපී පෙනෙන වර්ධනයක් සිදු වී ඇති බව වෘත්තීය පුහුණු කාර්ය සාධන තොරතුරු අනුව පැහැදිලි වෙයි (TVEC වාර්තා). ඒ අනුව 1995 වර්ෂය වන විට පුහුණුව ලැබූ සංඛ්‍යාව 15000ක් පමණ වුවත් 2015 වන විට සමස්ත පුහුණු සංඛ්‍යාව 130,000 දක්වා වර්ධනය වී ඇත.

වෘත්තීය පුහුණුව හා අධ්‍යාපනය, මානව ප්‍රාග්ධනයේ ප්‍රධාන අංශ ලෙස සැලකෙන අතර, එම අංශවල බලපෑම අධ්‍යයනය කිරීම සඳහා මින්සර් (1958) විසින් හඳුන්වා දෙන ලද මානව ප්‍රාග්ධන න්‍යාය ඉතා වැදගත් වෙයි. මානව ප්‍රාග්ධන න්‍යාය ගත් විට භෞතික ප්‍රාග්ධනය මෙන් රටක නිෂ්පාදනය හා ආර්ථික අභිවෘද්ධිය තීරණය කිරීමට මානව ප්‍රාග්ධනය ද ප්‍රධාන වශයෙන් බලපාන බව ආර්ථික විද්වතුන් පෙන්වා දී ඇත [Mincer (1958), Backer (1964), Schultz (1961), Card (1995), Psacharopoulos (1980,1994)]. මෙහි දී මානව ප්‍රාග්ධනය ලෙස සලකනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ශ්‍රම ඵලදායිතාව තීරණය කරන අධ්‍යාපනය, සෞඛ්‍ය ක්‍රීඩා යන සාධක වෙයි. අධ්‍යාපනය ගත් විට පාසල් අධ්‍යාපනය සහ කාර්මික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව ලෙස ප්‍රධාන කොටස් දෙකක් දැක්විය හැකි ය. මින් කාර්මික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව ගත් විට පුද්ගලයාගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කරන අතර උසස් අධ්‍යාපනයේ දී වැඩි වශයෙන් දැනුම වර්ධනය කරන බව ද දැක්විය හැක.

මානව ප්‍රාග්ධන විචල්‍යය අතුරින් මේ අධ්‍යයනයේ දී කාර්මික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව ඉලක්කගත කර ඇති අතර, ශ්‍රී ලංකාව සම්බන්ධව මේ වන විට කාර්මික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව සඳහා රජය විසින් භාණ්ඩාගාර අරමුදල් මෙන් ම අන්තර්ජාතික ව්‍යාපෘති මඟින් විශාල ආයෝජනයක් සිදු කරනු ලැබේ. මෙලෙස කරනු ලබන ආයෝජන හේතුවෙන් ආර්ථිකය කෙරෙහි පිළිගත හැකි බලපෑමක් ඇති කරන්නේ ද යන්න පිළිබඳ ගැටලුවක් පවතියි.

මෙහි දී වෘත්තීය පුහුණුව ශ්‍රම වෙළඳපොළ හරහා ආර්ථිකයට ඇති කරන බලපෑම ප්‍රධාන වශයෙන් පෞද්ගලික ඉපයීම් වර්ධනය කිරීම, රැකියා නියුක්තිය හා සමස්ත ආර්ථික වර්ධනයට ඇති කරන බලපෑම කුමක් ද? යන්න හඳුනා ගැනීමත් එම බලපෑම තවදුරටත් ධනාත්මක ව වර්ධනය කර ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමත් මේ අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වී ඇත.

මෙහි දී වෘත්තීය පුහුණුව මානව ප්‍රාග්ධනයේ ප්‍රධාන විචල්‍යයක් වන අතර ඒ පිළිබඳ ව අධ්‍යයනයේ දී සමස්ත මානව ප්‍රාග්ධනය පිළිබඳ අධ්‍යයනයට ලක්කර ඇත. ඒ මගින් ආර්ථිකය කෙරෙහි භෞතික ප්‍රාග්ධනයට සාපේක්ෂව මානව ප්‍රාග්ධනය ඇති කරන බලපෑම අධ්‍යයනය කරන ලදි. විස්තරාත්මක දත්ත විශ්ලේෂණය හා ප්‍රතිපායන විශ්ලේෂණ ක්‍රම අනුව මේ කරුණු පාසල් අධ්‍යාපනය, දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය ඇතුළු භෞතික ප්‍රාග්ධන හා මානව ප්‍රාග්ධන විචල්‍ය කිහිපයක් පාලන විචල්‍ය ලෙස ගෙන සංසන්දනාත්මකව විශ්ලේෂණය කර අදාළ නිගමන ඉදිරිපත් කර ඇත.

අධ්‍යයනයේ අරමුණු ළඟා කර ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලද ශ්‍රම බළකා අධ්‍යයනයේ එක් තෝරා ගත් වර්ෂයක (2004) දත්ත හා සාර්ව ආර්ථික විචල්‍යයන්ට අදාළ ද්විතීයික දත්ත, අන්තර්ජාතික හරස්කඩ දත්ත, ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා දත්ත මේ සඳහා යොදා ගෙන ඇත.

ඉපයීම් ශ්‍රිතය ඇස්තමේන්තු කිරීම අනුව වෘත්තීය පුහුණු සාමාන්‍ය පලදායි තා අනුපාතය 21%ක් සහ අධ්‍යාපන ආන්තික පලදායි තා අනුපාතය 8%ක් වී ඇත. අධ්‍යාපනයට සාපේක්ෂව වෘත්තීය පුහුණුව ඉපයීම් කෙරෙහි ඉහළ බලපෑමක් කරන බව නිගමනය කර ඇත. මෙහි දී ස්ත්‍රී පුරුෂ භාවය අනුව ස්ත්‍රියන්ට වඩා පුරුෂයන්ගේ ඉපයීම් හැකියාව 20%කින් පමණ ඉහළ මට්ටමක පවතියි. සාපේක්ෂව රැකියා පළපුරුද්ද සුළු වශයෙන් පුද්ගල ඉපයීම් සඳහා බලපා ඇත (3%). තවද වෘත්තීය පුහුණුව මඟින් ශ්‍රම වෙළෙඳපොළෙහි ස්ත්‍රී පුරුෂ පරතරය අඩු කිරීමට බලපෑම් කළ හැකි බව ද හඳුනා ගෙන ඇත. එමෙන්ම අධ්‍යාපනය වෘත්තීය පුහුණුව සමග අනුපූරක ලෙස සම්බන්ධ වී ඇති බව හඳුනා ගෙන ඇත.

තව ද සාර්ව විශ්ලේෂණය අනුව ආර්ථික වර්ධනය කෙරෙහි බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී මානව ප්‍රාග්ධන ආදායම් සංගුණකය භෞතික ප්‍රාග්ධන ආදායම් සංගුණකයට වඩා සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතින බව සොයා ගන්නා ලදි. ඒ අනුව වෘත්තීය පුහුණු සංගුණකය 0.07ක් වන අතර අධ්‍යාපන කාර්යසාධන සංගුණකය 0.45ක් වී තිබේ. [අපොස (උපෙ) සඳහා සුදුසුකම් ලැබූ ප්‍රතිශතය අනුව]. දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයට අදාළ සංගුණකය 0.09ක් වී ඇත.

මෙම සොයා ගැනීම පිළිබඳ තවදුරටත් හරස්කඩ දත්ත මඟින් විශ්ලේෂණය කරන ලදි. රටවල් 107ක වෘත්තීය පුහුණුව ඇතුළත් මානව ප්‍රාග්ධන දර්ශකය සමග පාලන විචල්‍යය වූ ක්‍රය ශක්තිය මත පදනම් වූ ඒක පුද්ගල ආදායම, නීතිමය පාලන දර්ශකය, දූෂණ සංජානන දර්ශකය යොදා ගෙන අනුසිහුම් කරන ලද වර්ධන ආකෘතිය

අනුව ශ්‍රී ලංකාවේ කාල ශ්‍රේණි දත්ත මගින් ලැබුණු ප්‍රතිඵල හා නිගමන තවදුරටත් තහවුරු විය. ඒ අනුව ආර්ථික වර්ධනය සඳහා භෞතික ප්‍රාග්ධනය ඇති කරන බලපෑම මෙන් කිහිප ගුණයක බලපෑමක් මානව ප්‍රාග්ධනය මගින් ඇති කරන බව තහවුරු විය. එමෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයේ හීන වන පරිමාණානුකූල පල පවතින බවට මෙම ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන අතර දිගු කාලීන ආකෘති භාවිතා කර මෙම නිගමන තහවුරු කර ගැනීම අවශ්‍ය වේ.

තව ද මේ අධ්‍යයනයේ විශ්ලේෂණ අනුව ආර්ථික වර්ධනය සඳහා භෞතික ප්‍රාග්ධනය වැදගත් නොවේ යැයි අදහස් නො කරන අතර, රටක නීතිමය පාලනය, දූෂණ හා වංචාවලින් තොර දුර්වල මානව ප්‍රාග්ධනය සහිත රටක භෞතික ප්‍රාග්ධන ආයෝජන ඉහළ දැමීම පලදායි නොවන බව ද අධ්‍යයනය මගින් නිගමනය කර ඇත.

අධ්‍යයනය සමස්තයක් ලෙස ගත් විට ශ්‍රී ලංකාවේ වෘත්තීය අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් අධ්‍යාපනය සමග අනුපූරක ලෙස සම්බන්ධ වී පිළිගත හැකි මට්ටමේ බලපෑමක් ශ්‍රම වෙළෙඳපොළ හරහා ආර්ථිකය කෙරෙහි ඇති කරන බව නිගමනය කර ඇත. එහෙත් සාර්ව මට්ටමේ විශ්ලේෂණය අනුව පහළ මට්ටමේ බලපෑමක් ඇති කරන අතර ඒ සඳහා ක්ෂේත්‍රය තුළ පවතින අභ්‍යන්තර හා බාහිර ගැටලු බලපා ඇත. ඒ අතර සිසුන් පාඨමාලා අත්පත් කර ගැනීමේ දුර්වලතාව, පුහුණුවේ ගුණාත්මක බව, ශ්‍රම වෙළෙඳපොළ අවශ්‍යතා සමග නොගැළපීම, පුහුණු ලාභීන්ගේ විරැකියාව, රැකියා අභිමුඛ පාඨමාලා සඳහා යොමු වීමේ ප්‍රතිශතය පහළ මට්ටමක පැවතීම, ප්‍රමුඛ වර්ධන ක්ෂේත්‍ර සඳහා පුහුණු වැඩසටහන් ඉලක්ක නොවීම, පාසල් අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව හා ශ්‍රම වෙළෙඳපොළ ඉල්ලුම අංශය අතර සම්බන්ධතාව දුරස්ව පැවතීම, වෘත්තීය මාර්ගෝපදේශන දුර්වල මට්ටමක පැවතීම යනාදි ගැටලු ඒ අතර ප්‍රධාන ගැටලු ලෙස අනාවරණය කරන ලදි.

මෙම ගැටලු සඳහා විසඳුම් මෙන් ම ක්ෂේත්‍රයේ ඵලදායීතාව වර්ධනය කිරීම සඳහා යෝජනා වශයෙන් මේ ක්ෂේත්‍රය වෙත රජයේ වියදම් ප්‍රතිශතය දැනට පවතින ද.දේ.නි යෙන් 0.19% මට්ටම අවම වශයෙන් සිව් ගුණයකින් වත් ඉහළ දැමීම සුදුසු බව යෝජනා කර ඇත. අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය, පුහුණු කාර්ය මණ්ඩල ධාරිතාව වර්ධනය කිරීම, පාසල් අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව සහ රැකියා වෙළෙඳපොළ අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම කළ යුතු වේ.

ආර්ථිකයේ ප්‍රමුඛ වර්ධන ක්ෂේත්‍ර සඳහා සිසුන් ආකර්ෂණය කිරීම සඳහා සුදුසු මූල්‍ය ආධාර ක්‍රමයක් ලෙස අධ්‍යාපන වියදම් වවුචර් ලබා දීම සුදුසු බව යෝජනා කර ඇත. ඒ සමග අප රට අයත් කලාපයේ ක්‍රමවත් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු පද්ධති සහිත කොරියාව සිංගප්පූරුව වැනි රටවල් ආදර්ශයට ගැනීම, උතුරු යුරෝපීය හා සංවර්ධිත රටවල ඉහළ ආර්ථික වර්ධනයට හේතු වූ මානව ප්‍රාග්ධනය, නීතිමය පාලනය හා වංචා දූෂණවලින් තොර වීම සඳහා එම රටවල් දිගු කාලීනව ගෙන ගිය උපාය මාර්ග ආදර්ශ ශ්‍රී ලංකාව තුළ ගැළපෙන ලෙස ක්‍රියාත්මක කරවීම ඉතා වැදගත් බව ද පර්යේෂණය මගින් යෝජනා කර තිබේ. ඒ සඳහා ප්‍රතිපත්ති සැලසුම් හා ඒකාබද්ධ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වන බව පෙන්වා දී ඇත.